# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1739/19 - 2012 ජනවාරි 05 වැනි බ්‍රහස්පතින්දා - 2012.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ආගාමික හා විගාමික පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු (351 වැනි අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 2 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් කරන ලද නියමය.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියමය

1. මේ දක්වා විවිධ අවස්ථාවලදී අමාත්‍යවරයා විසින් කරන ලද නියමයන් මගින් ශ්‍රී ලංකා රජය විසින් විවිධ රටවල පුරවැසියන්ට නිර්ව්‍යාජ සංචාරකයන් හෝ ව්‍යාපාරිකයන් වශයෙන් ශ්‍රී ලංකාවට ඇතුලු වී මසක් නොඉක්මවන කාලයක් ශ්‍රී ලංකාවේ රැඳී සිටීම සඳහා වීසා බලපත්‍රයක් සතුව තිබීම යන නියමයෙන් නිදහස් කිරීම 2012.01.01 දින සිට බලපවත්වන පරිදි මෙයින් අවලංගු කෙරේ.

2. එසේ වුවද, දැනට රටට ඇතුල්වීමේදී වීසා ලබා ගැනීමෙන් නිදහස් කිරීමේ පහසුකම ශ්‍රී ලාංකික නිර්ව්‍යාජ සංචාරකයන්ට හෝ ව්‍යාපාරිකයන්ට ලබා දී ඇති රටවල්වල පුරවැසියන් නිර්ව්‍යාජ සංචාරකයන් හෝ ව්‍යාපාරිකයන් වශයෙන් ශ්‍රී ලංකාවට ඇතුල්වීමේදී වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම තව දුරටත් ක්‍රියාත්මක වේ.

3. ශ්‍රී ලංකා රජය සමඟ රාජකාරි හා රාජ්‍යතාන්ත්‍රික ගමන් බලපත්‍රධාරීන් සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා එකඟත්වයට පැමිණ ඇති වීසා සම්බන්ධයෙන් වන විධි විධාන තවදුරටත් අදාළ ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක වේ.

4. ඉහත (2) (3) වගන්ති වලින් ආවරණය නොවන සියලුම රටවල පුරවැසියන් කෙටිකාලීන අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමේදී 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංචරණය සඳහා වූ විද්‍යුත් අනුමැතිය (Electronic Travel Authority) ක්‍රමය මගින් වීසා සඳහා පූර්ව අනුමැතිය ලබා ගෙන ශ්‍රී ලංකාවට පැමිණිය යුතු ය.

01 - 473

1A - G 15516 — 340 (2012/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.